## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

### 2022 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (2021/2020/2019 පුනර්) සහ ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (2018/2017/2015/2014 පුනර්) (නව නිර්දේශය) - 2025 මාර්තු / අප්‍රේල්/ මැයි

**අපේක්ෂකයන් සඳහා උපදෙස්**

- පරීක්ෂණය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම කාල සටහනේ සඳහන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී මෙම ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.
- විභාග අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් කිසිම හේතුවක් මත විභාග මධ්‍යස්ථානය අසලට පැමිණීමෙන් වැළකිය යුතු අතර පරිශ්‍රය තුළට කිසිදු වාහනයක් ඇතුළු නොකළ යුතුය.
- විභාග පැවැත්වීම සම්බන්ධයෙන් සංශෝධිත නීති රීති ඇතුලත් පොත (By- Law) www.external.sjp.ac.lk වෙබ් අඩවියෙහි පල කර ඇත. ඒ සම්බන්ධයෙන් දැනුවත්ව පැමිණීම අනිවාර්ය වේ.
- ඔබට යම් රෝගී තත්ත්වයක් පවතී නම් වහාම විභාග නිරීක්ෂක නිලධාරියෙකුට හෝ විභාග ශාලාධිපතිට දැන්විය යුතුය.
- අවශ්‍ය ආහාර පාන තමා විසින්ම රැගෙන ආ යුතු අතර ඔබට අදාළ විභාග අවසන් වන තෙක් විභාග මධ්‍යස්ථානයෙන් බැහැරව යෑම නොකළ යුතුය.
- විභාග මධ්‍යස්ථානය පැවැත්වෙන භූමියේ වෙනත් පරිශ්‍ර වලට අනවශ්‍ය පරිදි ගමන් කිරීමෙන් වැළකිය යුතුය.
- පරිශ්‍රය තුළට කිසිදු අපද්‍රව්‍යයක් බැහැර නොකළ යුතුය. ඔබ අප සැමගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම පිණිස සහාය වන්න.

**බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු/වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්**

- මෙම පරීක්ෂණය සඳහා පළමුවර පෙනී සිටින **2022 ශිෂ්‍ය කණ්ඩායමේ අපේක්ෂකයන්ට සහ 2020/2021 වෛද්‍ය වාර්තා (MC) ලෙස ප්‍රතිඵල ලේඛනයේ සඳහන් අපේක්ෂකයන්ට** පමණක් මෙවර පරීක්ෂණයට අයදුම් කර පෙනී සිටීමට නොහැකිවූයේ නම් පහත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** පෙර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

1. බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු /වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීමට අපගේ external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි ඇති අයදුම්පත (සිංහල හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් ) බාගත කරගෙන නිවැරදිව සම්පූර්ණ කර ඒ සමග අමුණා පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. (ඡායාපිටපත් ළඟ තබාගන්න)

2. ඉහත දක්වා ඇති 428 වන සනාතන සභාව මගින් අනුමත කරුණු හොඳින් කියවා බලා ඒ අනුව වලංගු වෛද්‍ය සහතික පමණක් ඉදිරිපත් කළ යුතුය. (ඉහත තීරණායකයන්ගේ යම් සංශෝධනයක් සිදුවේ නම් වෙබ් අඩවිය හරහා දැනුවත් කරනු ලැබේ).

3. කිසිදු අවස්ථාවක **විභාග මධ්‍යස්ථානයේදී සේවක භවතුන්ට** හෝ **පිළිතුරු පත්‍රය සමග අමුණා** හෝ **විභාග ප්‍රවේශ පත්‍රය සමග අමුණා විභාග ශාලාවේදී** හෝ භාර දීම **නොකල යුතුය.** එසේ භාරදෙන වෛද්‍ය වාර්තා සම්බන්ධයෙන් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකියනු නොලැබේ.

## 2025 මැයි 03 වන දින සිට

## සංශෝධිත විභාග කාලසටහන

2025 මැයි මස 06 වන දින පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය හේතුවෙන් ඉහත සඳහන් උපාධි පරීක්ෂණයේ 2025 මැයි 03 වන දින සිට පැවැත්වීමට තිබූ විෂයන්ට අදාල ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පහත පරිදි සංශෝධනය වේ.

| සැලසුම්කර තිබූ දිනය | සංශෝධිත දිනය | පෙ.ව 9.00 - ප.ව 12.00 | ප.ව 1.30 - ප.ව 4.30 |
|---|---|---|---|
| 2025.05.03<br>සෙනසුරාදා | 2025.05.17<br>සෙනසුරාදා | ANGE 2001 - මානව විද්‍යා න්‍යාය | ANGE 2002 - ජනශ්‍රැති අධ්‍යයනය හා අස්පර්ශණීය සංස්කෘතික උරුමය |
| 2025.05.04<br>ඉරිදා | 2025.05.31<br>සෙනසුරාදා | ARGE 2001 - පුරාවිද්‍යාවේ මූලධර්ම හා ක්ෂේත්‍ර පුරාවිද්‍යාව | ARGE 2002 - අභිලේඛන හා අක්ෂර රූප විද්‍යාව |
| 2025.05.10<br>සෙනසුරාදා | සංශෝධනය නොවේ | SOFT 2002 - නායකත්වය හා පෞරුෂ සංවර්ධනය (2014/2015/2017/2018/ 2019/2020/ 2021/2022) | SOFT 2001 - ශ්‍රී ලාංකේය සමාජය (2014/2015/2017/2018/ 2019) |
| 2025.05.11<br>ඉරිදා | සංශෝධනය නොවේ | GENG 2005- English in use II (2020/2021/2022) | GEIT 2001- Microsoft Office for Workplace Productivity (2020/2021/2022) |

**ප්‍රායෝගික පරීක්ෂණ**

| **සැලසුම්කර තිබූ දිනය** | **සංශෝධිත දිනය** | **පෙ.ව 8.00 - ප.ව 5.00** |
|---|---|---|
| 2025.05.17 **සෙනසුරාදා** | 2025.05.24 **සෙනසුරාදා** | MUGE 2001 - උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (ගායනය) - ප්‍රායෝගික II |
| 2025.05.18 **ඉරිදා** | 2025.05.25 **ඉරිදා** | MUGE 2003 - උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය (වාදන) - ප්‍රායෝගික II |
| 2025.05.17 **සෙනසුරාදා සහ** 2025.05.18 **ඉරිදා** | 2025.05.24 **සෙනසුරාදා සහ** 2025.05.25 **ඉරිදා** | DAGE 2002 - නර්තන ප්‍රායෝගික II (උඩරට/ පහතරට/ සබරගමු) |

**සැලකිය යුතුයි :**

- මෙම පරීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කයේ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ. **ඔබගේ ප්‍රවේශ පත්‍රයේ විභාග මධ්‍යස්ථාන කේතය සහ පසුපිටෙහි සඳහන් විභාග මධ්‍යස්ථානය ඉතා අවධානයෙන් පරීක්ෂා කර ඔබට නියමිත විභාග මධ්‍යස්ථානය වෙත පැමිණෙන්න.**

- ඔබ වෙත දැනට නිකුත් කර ඇති විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග මධ්‍යස්ථානයේදීම අදාල පරීක්ෂණ පැවැත්වේ.

- මෙම සංශෝධනය වෙනුවෙන් නව විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් නොකරන අතර මේ වන විට ඔබ වෙත ලබා දී ඇති විභාග ප්‍රවේශ පත්‍රය අදාල සංශෝධිත දිනයන්හි පරීක්ෂණ සඳහා වලංගු වේ.

- මෙම පරීක්ෂණයෙහි සහ විභාග මධ්‍යස්ථානයන්හි යම් සංශෝධනයක් වුවහොත් **www.externel.sjp.ac.lk** වෙබ් අඩවිය හරහා දැනුවත් කරනු ලැබේ.



ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.04.25